# ආගමික වේලාව

මෙකල ඇතැම් ගෙවල් වල බුදුන් වැඳීමට ස්ථානයක්, කුඩා මන්දිරයක් ද හදාගෙන ඇත. එය ඉතා හොඳයි. ඇතැම් අය උදේ සවස බුදුන් වදිනවා. මල්-පහන් ආහාර-පාන පූජා කරනවා. සුන්දර ප්‍රතිපදාවෙකි.

එසේ ම හැම ගෙදරක ම ආගමික වේලාවක් සම්මත කර ගත යුතු ය. මේ කටයුත්තට දෙමාපියන් සිටිය යුතු බැවින් විශේෂයෙන් පියාණන්ට පහසු වේලාවක් වීම හොඳයි. මේ කටයුත්තට ලොකු ළමයින් මෙන් ම කුඩා ළමයින් ද සහභාගී කරගත යුතු බැවින් රෑ නොවිය යුතුය.

දෙමාපියන් ගේ ආදර්ශය දරුවනට ලැබිය යුතුම හෙයින් මවුපිය දෙදෙනා ම සහභාගී විය යුතුම යි. නො වැලැක්විය හැකි කටයුත්තක් යෙදුණත් එක්කෙනෙකු හෝ සහභාගී විය යුතුය. යම් විදියෙකින් ගෙදරට අමුත්තකු දෙදෙනකු පැමිණියොත් හදිස්සියක් නොවේ නම් ඒ අයත් ආගමික වේලාවට සහභාගී කරගත යුතුය. එසේ කිරීමෙන් යහපත් දෙකක් සිදු වෙනවා.

1. එසේ සහභාගී වූ අය සිය නිවෙස්හිත් ආගමික වේලාවක් ආරම්භ කිරීම
2. නැවත මේ වේලාවට නො පැමිණීම

නියමිත වේලාවට ගෙදර සියලු දෙනාම බුදුන් වදින තැනට හෝ සුදුසු තැනකට හෝ රැස් වී පහත සඳහන් කරුණු ටික සම්පූර්ණ කළයුතු වේ.

1. පන්සිල් සමාදන් වීම.
2. බුදුන් වැඳීම, මල් පහන් පිදීම.
3. කරණීයමෙත්ත සූත්‍රයවත් එකර සජ්ඣායනා කිරීම.
4. ළමයිනටත් ගැලපෙන පරිදි සුළු වේලාවක් භාවනා කිරීම.
5. බණ පොතකින් පිටු දෙකක් වත් කාටත් ඇසෙන සේ කියවීම.
6. දරුවන්ගේ කටයුතු සොයා බලා අවවාද කිරීම.
7. දෙවියනට පින් දීම (ආකාසට්ඨාච...)
8. දරුවන් දෙමාපියන්ට වැඳ කටයුතු අවසන් කිරීම.

කුඩා දරුවන් සහභාගී වන නිසා භාවනාව මෙසේ යොදාගැනීම මැනැවි.

“මම නිදුක් වෙම්වා, නීරෝගී වෙම්වා, සුවපත් වෙම්වා. මා මෙන්ම සියලු සත්වයෝ ද නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා, සුවපත් වෙත්වා” යි කාටත් ඇසෙන සේ පස් වාරයක් හීන් හඬින් කියා එය ම නිහඬව පස් වාරයක් සිතීම.

බණ පොතෙකින් දවසකට පිටු දෙකක් කියවූ විට මාසයකට පිටු හැටක කරුණු ඉගෙන ගනී. අවුරුද්දකර පිටු 728ක කරුණු ඉගෙන ගනී.

පුරාණ කාලයෙහි කටුයුතු බහුල රජවරු ද මේ නයින් බොහෝ බණ ඉගෙන ගත්තා. සැදැහැවත් ජනතාව ද එසේ ම ඉගෙන ගත්කා. සමහර රජවරු අභිධර්මයෙන් ද බණ කියා ඇත.

මඩිහේ පඤ්ඤාසීහ ස්ථවිර